www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 9/11 සිට පස් වසරක දේශපාලන ශේෂ පත්‍රයක්

## දෙවැනි කොටස

**Five years since 9/11: A political balance sheet**
**Part two**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2006 සැප්තැම්බර් 12**

### ඇෆ්ගනිස්ථාන හා ඉරාක ආක්‍රමනයන්

9ඍ11 ප්‍රහාරයෙන් යන්තම් මාසයකට පසුව ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය'' ප්‍රකාශයට පත් කරමින් බුෂ් පරිපාලනය එයට ප්‍රතිචාර දැක්වීය. බුෂ් පරිපාලනය ඇෆ්ගනිස්ථාන ආක්‍රමනය ආරම්භ කලේ තලිබාන් ආන්ඩුව, ඔසාමා බින් ලාඩන්ට හා අල් කයිඩාවට අභයභූමියක් සම්පාදනය කිරීමේ පදනම මත ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ'' ක්‍රියා මාර්ගය නීති යුක්ත කරමිනි.

යුද්ධය සඳහා සිය වනචාරී උද්යෝගය ප්‍රදර්ශනය කල මාධ්‍ය, ඇෆ්ගනිස්ථානයෙහි ඇමරිකානු මැදිහත්වීමේ ඉතිහාසය, තලිබාන් සමග එහි සම්බන්ධතාවන් මෙන් ම බින් ලාඩන්ගේ කටයුතු උනන්දු කිරීමේදී හෝ අල් කයිඩාව නිර්මානය කිරීමේදී එක්සත් ජනපදයේ ක්‍රියාකලාපය පරීක්ෂා කිරීමට උනන්දුවක් නො දැක්වීය.

ජිමී කාටර්ගේ පරිපාලන අවධියේදී, කාබුල්හි සෝවියට් පිටුබලය ලත් පාලන තන්ත්‍රයට එරෙහිව, ඉස්ලාමීය ත්‍රස්තවාදය නගා සිටුවීමට ගත් තීරනයට, 9/11 සිදුවීම් සම්බන්ධ කල හැකි අතර, එය මාධ්‍ය විසින් පරීක්ෂා කිරීමට අකමැති මාතෘකාවකි. 1980 ගනන්වල ඇෆ්ගනිස්ථානයේ ඉස්ලාමීය ත්‍රස්තවාදීන් සහතික ලෙස ම විශාල ඇමරිකානු මිලිටරි හා මූල්‍ය පහසුකම් භුක්ති වින්දාහ. මුජහිඩීන් නියෝජිතයන් ධවල මන්දිරයේ ඕවල් කාර්යාලයට ආරාධනා ලැබූ අතර ඇමරිකාවේ මුල් පීතෘවරයන්ගේ සදාචාරාත්මක සමගාමීන් ලෙස ජනාධිපති රේගන් විසින් වර්නනා කරන ලදී.

බින්ලාඩන් සම්බන්ධයෙන් ගත්විට ඔහු, සිය ත්‍රස්තවාදී කටයුතු ආරම්භ කලේ ඇෆ්ගනිස්ථානය තුල සීඅයිඒ හි වස්තුවක් ලෙසිනි. අවසාන වසයෙන් තලිබාන් ව්‍යාපාරය එක්සත් ජනපදය විසින් පෝෂනය කල, ඇෆ්ගනිස්ථානයේ ව්‍යසනය තුලින් නැගී ආ අතර, එක්සත් ජනපදයේ ආධාරයෙන් 1990 ගනන් මැද, බලයට පත්විය.

මෙම යුද්ධයේ සැබෑ අරමුන කවරේද? මෙම ප්‍රශ්නයට පිලිතුරු දීමේ දී මම, ජෝන් රීඩ් නමැති විශිෂ්ට පෙරලිකාරී මාධ්‍යවේදියාගේ සිනමා ජීවිත කතාව එනම් *Reds* (රත්තෝ) චිත්‍රපටයේ ආරම්භක දර්ශනයක් සිහිපත් කරන්නෙමි. එවකට ප්‍රථම ලෝක සංග්‍රාමය හඳුන්වනු ලැබූ ඊනියා මහා සංග්‍රාමය ආවරනය කරමින් සිටි ඔහු, යුරෝපයේ සිට පෙරලා පැමිනි දිනවල ම, ඔරිගන් ප්‍රාන්තයේ ඔහුගේ උපන් ගම වූ පෝට්ලන්ඩ්හි ලිබරල් සමාජ ශාලාවේ රැස්වීමකට සහභාගි විය. එහි දී ඔහු, ඇසින් දුටු සාක්ෂිකරුවකු ලෙස යුද්ධය පිලිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා වේදිකාවට කැඳවනු ලැබීය.

යුරෝපයේ යුද්ධයෙහි සුලමුල කවරේදැයි පැහැදිලි කරන ලෙස ලිබරල් සමාජ ශාලාවේ සභාපති රීඩ්ගෙන් ඉල්ලා සිටියේ ය. රීඩ් රැස්වීම් ශාලාව හොඳින් නිරීක්ෂනය කර "ලාභය" යයි එක් වචනයකින් පිලිතුරු සපයමින්, අසුනෙහි වාඩිවිය.

ඇෆ්ගනිස්ථාන යුද්ධය පිලිබඳව ඊටත් අඩු සංක්ෂිප්ත පැහැදිලි කිරීමක් සැපයීමට යමෙකුට නොහැකි වෙතත් මෙහි දී එක් වචනයක පිලිතුර වනු ඇත්තේ "තෙල්" ය. 2001 ඔක්තෝබර් 9 දින *ලෝසවෙඅ* "අප ඇෆ්ගනිස්ථාන යුද්ධයට විරුද්ධ කුමක් නිසාද" යන හිසින් පලකල ප්‍රකාශනයක මෙසේ සඳහන් කලේ ය.

"ඇෆ්ගනිස්ථානයෙන් ප්‍රවිශ්ඨයක් සැපයෙන කැස්පියන් මුහුදුබඩ කලාපය, ලෝකයේ සොයාගෙන ඇති තෙල් සංචිතවලින් සියයට 20ක ප්‍රමානයක් වන දල වසයෙන් බැරල් බිලියන 270ක් අඩංගු කර ගනියි. ග්‍රහලෝකයේ ස්වාභාවික ගෑස් සංචිතවලින් දල වසයෙන් 8න් පංගුවක් නොහොත් ඝන අඩි ට්‍රිලියන 665ක් ද එහි අඩංගු වේ.

"මෙම තීරනාත්මක සම්පත් පිහිටියේ, දේශපාලනිකව ලෝකයේ අවදානම් ම කලාපය තුලයි. ඇෆ්ගනිස්ථානයට පහර දීම මගින්, රූකඩ පාලන තන්ත්‍රයක් පිහිටුවීම හා විශාල මිලිටරි බලකායන් ප්‍රදේශය තුලට ගෙන ඒමෙන් එක්සත් ජනපදය අරමුනු කරන්නේ, තමන් රාජාන්තර නායකත්වයේ පාලනය හොබවන, නව දේශපාලන රාමුවක් පිහිටුවීමයි.''

මතුපිටින් වුවත් ආරම්භයේදී ම, එනම් 2001 සරත් කාලයේදී ඇෆ්ගනිස්ථානය තුල ඇමරිකානු මිලිටරිය ලත් සාර්ථකත්වයේ කුලුගැන්වීම වසයෙන් යුනෝකාල් තෙල් සමාගමේ හිටපු විධායක හමීඩ් කර්සායි, කාබුල්හි නව රූකඩ පාලන තන්ත්‍රයේ නායකයා ලෙස පත්කිරීමෙන් , බුෂ් පරිපාලනයට ඒත්තු ගියේ, මිලිටරි බලය යොදාගැනීම හරහා සාක්ෂාත් කරගත නොහැකි කිසිවක් නොමැති බවයි. 2002 ඔක්තෝබරයේදී එය, නව ධර්මතාවක් වන ''ආරක්ෂක යුද්ධය'' මත පදනම් වූ ජාතික ආරක්ෂක මූලෝපායක් නිරාවරනය කලේ ය. ඇමරිකාවේ ආරක්ෂාවට තර්ජනයක් එල්ලවන්නේ යයි හඳුනාගත් ඕනෑම රටකට එරෙහිව මිලිටරි පියවර ගැනීමෙහි අරමුන හා එය සතු යයි පැවසූ අයිතිය මෙමගින් ප්‍රකාශයට පත් කලේ ය.

සමීපව ඇති මිලිටරි ප්‍රහාරයකට එරෙහිව සෘජු හා ක්ෂනික ආත්මාරක්ෂාවට අසම්බන්ධිත, පුලුල් පරාසයක අවස්ථාවන්හි දී පාවිච්චි කල හැකි විදේශ පිලිවෙතේ නීත්‍යනුකූල උපකරනයක් ලෙස යුද්ධය වැලඳගැනීම මගින් නව ජාතික ආරක්ෂක මූලෝපාය එක්සත් ජනපද විදේශ පිලිවෙතෙහි පදනමෙහි ම පිහිටුවනු ලබන්නේ, 1946 නියුරම්බර්ග් යුද අපරාධ විනිශ්චය මන්ඩලය මගින් සාපරාධී යයි හෙලාදැක ඇති සංකල්පයන් ය.

9/11 සිදුවීම්වලට කවරාකාරයකින් හෝ සම්බන්ධයක් නො තිබුනු ආන්ඩුවක් සහිත රටක් වූ, ඉරාකය ආක්‍රමනය සඳහා දැන් වේදිකාව සැකසී තිබේ. අල් කයිඩාව හා සදාම් හුසේන් තන්ත්‍රය අතර ව්‍යාජ හුයපටවල් ගොතනු ලබමින් තිබෙන අතරතුර, එක්සත් ජනපද ආන්ඩුව සිය ප්‍රධාන අවධාරනය යොදනු ලැබුවේ ඉරාකය සතුව ඊනියා ජනඝාතක අවි තිබේය යන චෝදනාව මත ය. 2002 අගෝස්තුවේ පටන් ඉරාක ආක්‍රමනය ආරම්භ කල 2003 මාර්තු අතර ආන්ඩුවේ හා මාධ්‍යවල අනුග්‍රහය ලැබූ බොරු ප්‍රචාරය කිරීමේ උග්‍ර ව්‍යාපාරයකට ඇමරිකානු ජනතාව ගොදුරු කරන ලදී.

යුද්ධයට පක්ෂපාතී තිරස්චීන උද්ඝෝෂන ව්‍යාපාරය හිනිපෙත්තට නගිද්දී, එක්සත් ජනපදයේ හා එහි බ්‍රිතාන්‍ය ආන්ඩු සගයන්ගේ යුද සැලසුම්වලට ජනතාවගේ ජාත්‍යන්තර විරෝධයන් ප්‍රකාශයට පත්වූයේ 2003 පෙබරවාරියේ දී ලොව පුරා පැවැත්වුනු දැවැන්ත පෙලපාලි මගිනි.

2003 මාර්තු 20 දින, එක්සත් ජනපදය එහි යුද්ධය දියත් කල අතර පසු දින ලෝසවෙඅ මෙසේ ප්‍රකාශකලාය. "එක්සත් ජනපදය විසින් කුපිතකාරී නොවූ තතු තුල ද, නීති විරෝධීව ද, ඉරාකය ආක්‍රමනය කිරීම අපකීර්තිමත් සිදුවීමක් ලෙසින් පවතිනු ඇත. මෙම යුද්ධය දියත් කල වොෂින්ටන් හි දේශපාලන අපරාධකරුවන්ද, ලේ ස්නානයෙන් ප්‍රමෝදයට පත් ජනමාධ්‍යයේ කාලකන්නි මදාවිකාරයන් ද, මේ රට ලජ්ජාවෙන් පුරවා තිබේ. ලෝකයේ සෑම කොනකම කොටි සංඛ්‍යාත ජනතාව, අනාරක්ෂිත කුඩා රටක් කුඩු කර දමන තිරිසන් හා අසීමිත මිලිටරි ශක්තිය ප්‍රදර්ශනය කිරීම හමුවේ තිගැස්මට ලක් විය. මෙම ඉරාක ආක්‍රමනය වනාහි, යෙදුමේ සම්භාවනීය අරුතෙන් ම, අධිරාජ්‍යවාදී යුද්ධයකි. එක්සත් ජනපදයේ ව්‍යාපාර හා මූල්‍ය කතිපයාධිකාරීන්ගේ වඩාත්ම කොල්ලකාරී හා ප්‍රතිගාමී කොටස්වල අවශ්‍යතාවන් වෙනුවෙන්, ආක්‍රමනයේ මෙම අවම ක්‍රියාව භාරගෙන තිබේ. එහි සෘජු හා ක්ෂනික කර්තව්‍යය වනුයේ ඉරාකයේ විශාල තෙල් සම්පත්වල පාලනය හා දිගු කලක් තිස්සේ පීඩාවට පත්කර තිබෙන එරට, ඇමරිකානු යටත්විජිත වැයික්කියක් බවට ලඝුකොට දැමීම ය..."

"යුද්ධයම නියෝජනය කරන්නේ ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදයේ ව්‍යසනකාරී අසාර්ථකත්වය යි. සැඟවුනු න්‍යායපත්‍රයක් ඇතිව වැඩ කරන හා වංචාව පදනම් කර ගෙන බලයට පැමිනි, දේශපාලන කුමන්ත්‍රනකරුවන්ගේ කුඩා කල්ලියක්, ඇමරිකානු ජනතාවට අනවශ්‍ය මෙන් ම, නොවැටහෙන යුද්ධයකට, ඔවුන් ඇද දමා තිබේ. එහෙත්, බුෂ් පරිපාලනයේ ප්‍රතිපත්තිවලට එනම්, යුද්ධයට, ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කෙරෙන ප්‍රහාරයන්ට, සමාජසේවා විනාශ කිරීමට, කම්කරු පන්තියේ ජීවන තත්වයන්ට එල්ල කරන රුදුරු ප්‍රහාරයන්ට විරෝධය පෑ හැකි පිලිගත් මොනම දේශපාලන යාන්ත්‍රනයක් වත් ඇත්තේ නැත. ධනේශ්වර ලිබරල්වාදයේ මලකුන ලෙස ඩිමොක්‍රටික් පක්ෂය, ගැඹුරෙන්ම අපකීර්තියට පත්ව තිබේ. වැඩ කරන ජන සමූහයා තමන්ගේ පුරවැසි භාවය අහෝසිකර ඇති බව දැකගනිති."

අවසානයේ දී එය මෙසේ සඳහන් කලේ ය. "20 වැනි සියවස නිස්කාරනේ ජීවත් නොවී ය. එහි ජයග්‍රහනයන් මෙන් ම ඛේදවාචකයන් ද කම්කරු පන්තියට නොමිනිය හැකි දේශපාලන පාඩම් උරුම කර දී තිබේ. ඒ අතරින් වඩාත්ම වැදගත් වන්නේ අධිරාජ්‍යවාදී යුද්ධයේ වැදගත්කම හා ඇඟවීම් පිලිබඳ අවබෝධයයි. සියල්ලටමත් වඩා එය ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිගතිතාවන්ට "සාමාන්‍ය" නාලිකාවක් ඇතුලත කිසිදු විසඳුමක් සොයාගත නොහැකි බව විද්‍යාමාන වීමයි. දැන් ආරම්භ වී ඇති ගැටුමේ ආරම්භක අදියරයන්හි ප්‍රතිඵලය කුමක් වුව ද, ඇමරිකානු අධිරාජ්‍යවාදයට ඇත්තේ විනාශයේ නවාතැනකි. එයට ලෝකය ජයගත නොහැකි ය. මැදපෙරදිග මහජනතාව යලි වතාවක් විජිතවාදී විලංගුවේ හිරකිරීම එයට කල නොහැකි ය. එහි අභ්‍යන්තර ව්‍යාධීන්ට පිලිගත හැකි විසඳුමක්, යුද්ධයේ මාධ්‍යය හරහා ඔවුන් සොයා නොගනු ඇත. ඒ වෙනුවට, යුද්ධය මගින් ඉස්මතු කරන පෙර

නොදක්නාලද දුෂ්කරතාවන් ද, නැගෙන ප්‍රතිරෝධයද , ඇමරිකානු සමාජයේ සියලු අභ්‍යන්තර විසංවාදයන් උග්‍ර කරනු ඇත."

ධනේශ්වරය ද ඔවුන්ගේ ක්ෂමාලාපකයන්ද අතොරක් නැතිව කියා පෑවේ මාක්ස්වාදය අසාර්ථක වී ඇති බවයි. මෙම කියාපෑම් නිෂ්ප්‍රභ කිරීමට අවශ්‍යවන්නේ, තම මාක්ස්වාදී විධික්‍රමයේ පදනම මත ලෝක සමාජවාදී වෙබ් අඩවියේ සමකාලීන සිදුවීම් පිලිබඳව ඉදිරිපත් කල විශ්ලේෂනය, ලෝක අධිරාජ්‍යවාදයේ නායකයන් විසින් ඉදිරිපත් කල දෑ සමග සැසඳීම පමනක්ම සෑහේ. 2003 මැයි 1 දින එක්සත් ජනපද ගුවන් යානා ගෙන යන නැවක නැගීගෙන බුෂ් ප්‍රකාශකලේ ඉරාකයේ ඇමරිකානු දූත මෙහෙවර ඉටුකර ගෙන තිබෙන බවයි. යථාර්ථයේ දී ලෝසවෙඅ විසින් පූර්වකථනය කල ව්‍යසනය යාන්තම් පටන් ගත්තා පමනි.

## "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" පස් වසර

ඉරාකය ආක්‍රමනය කර තෙවසරක් ගෙවීයද්දී, බුෂ් පරිපාලනය විසින් ප්‍රකාශයට පත් කල ඊනියා " ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" අන්ත වියවුලකට පත්ව තිබේ. 9/11 න් පසු කාලයේ දී බුෂ් විසින් ප්‍රකාශිත ගෝලීය යුද්ධයේ, හරි මැද පිහිටි ඉරාක මෙහෙයුම, මිලිටරි හා දේශපාලනික අභාග්‍යයක් බවට පත්ව තිබේ. "භීතිය හා කම්පනය" යන නාමය යටතේ ආරම්භ කල ආක්‍රමනයක් "කම්පනකාරී" යයි ඔප්පු කර ඇත්තේ මුලුමනින්ම කාලකන්නි අභ්‍යාසයේ කලමනා කරනය අංගලක්ෂික වී ඇති මුග්ධත්වයේ හා අදක්ෂතාවයේ පරිමාව තුල පමනි. ත්‍රස්තවාදයේ පරිමාව මගින් නිශ්චය කෙරෙන්නේ ඉරාක ජනතාව බියගැන්වීමේ හා විමතියට පත් කිරීමේ ලා ඇමරිකානු මිලිටරිය සතු හැකියාව පිලිබඳ බුෂ් පරිපාලනයේ අධික ලෙස වැඩි තක්සේරු කල බවයි.

බුෂ් පරිපාලනය විසින් දියත්කල අධිපතිවාදී ව්‍යාපෘතිය, ඉරාකයේ දී මූලික පරාජයක් අත්කරගෙන තිබේ. බුෂ්ගේ ධවල මන්දිරයේ සමීපතම පරිශ්‍රයෙන් පිටත ගෝලීයවම තක්සේරු කරන්නේ ඉරාක ආක්‍රමනයත්, යටත් කිරීමත්, නිශ්චිත හා මූලෝපායික ව්‍යසනයක් ලෙස ය. ඉරාකයේ ඇමරිකානු මැදිහත් වීම පිලිබඳ පැතිර පවතින දෘෂ්ටිය කැටි කර දක්වූ, යුද්ධය පිලිබඳව නව ග්‍රන්ථයක පාඨය වූයේ ඍසීජද (නින්දිත පරාජය) යි.

ඉරාකයේ දී ඇමරිකානු සෙබලුන් 2600 වැඩි සංඛ්‍යාවකගේ ජීවිත අහිමි විය. එක්සත් ජනපද ආක්‍රමනයෙන් මුදාහල ප්‍රචන්ඩත්වයේ ප්‍රතිඵල වසයෙන් ඝාතනය වූ ඉරාක වැසියන්ගේ සංඛ්‍යාව ලක්ෂයක් තරම් ය. ඇමරිකානු මිලිටරිය විසින් භාරගත් තිරිසන් සංසිඳුවීමේ ව්‍යාපාරය මධ්‍යයේ ම, සියලු වෛෂයික දර්ශකයන් පෙන්වන්නේ, ත්‍රස්තවාදයේ ශක්තිය වර්ධනය වෙමින් පවතින බවයි. බැග්ඩෑඩයේ පමනක් සෑම මසකම දහසකට වැඩි ඉරාකීයන් සංඛ්‍යාවක් ඝාතනයට ලක් වන අතර, මෙම බියකරු මිනිස් ඝාතනය පසෙකින් ආක්‍රමනයේ හා ඉන් පැන නැංවූ විරෝධයේ ආර්ථික ප්‍රතිවිපාක ද විනාශකාරී ය. නිර්බාධිතව ගලා යන ඉරාක තෙලින් යුද වියදම් පියවා ගැනීමේ බුෂ් පරිපාලනයේ බලාපොරොත්තු එක්සත් ජනපද ආන්ඩුවේ අනෙකුත් බොහෝ ගනන් බැලීම් පැවැත්මේ යථාර්ථයට සම්බන්ධිතව සුන් වී ඇත. ඉරාකය ආක්‍රමනය කලතැන් පටන් ත්‍රස්තවාදීන්, තෙල් සංකීර්නයන්ට එල්ල කර ඇති ප්‍රහාර සංඛ්‍යාව 700 ක් තරම් ය. මූලෝපායික හා ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානයේ මිලිටරි විශ්ලේෂක ඇන්තනි කෝඩ්ස්මන් විසින් සපයා ඇති අධ්‍යයනයකට අනුව

"තෙල් නිපැයුම 2005 වසරේ දී සියයට අටකින් පහල වැටුනි. උතුරු ඉරාක තෙල් නල මාර්ගය හරහා තුර්කියේ සීහාන් දක්වා කෙරෙන තෙල් නැව්ගත කිරීම්, යුද්ධයට පෙර දිනකට බැරල් 800,000ක සිට 2005 දී සාමාන්‍ය වසයෙන් දිනකට බැරල් 40,000 දක්වා වැටී ඇත. 2005 දී ඉරාක නිලධාරීන් ගනන් බලා ඇති අන්දමට ත්‍රස්තවාදී පහරදීම් නිසා දූනට මත් ඉරානයට ඩොලර් බිලියන 11ක පාඩුවක් සිදුව තිබේ. සදාම් හුසේන්ගේ වැටීමෙන් පසුව, හමුදා සභාගය, 2005 දිනකට බැරල් මිලියන 3ක් දක්වා ඉරාක තෙල් නිෂ්පාදනය ඉහල නැංවීමේ ඉලක්කයක් සැකසී ය. යුද පූර්ව මට්ටම වූ දිනකට බැරල් මිලියන 2.5ක සිට නිෂ්පාදනය, 2005 දී දිනකට සාමාන්‍යය බැරල් මිලියන 1.83ක් දක්වා පහත වැටුනු අතර දෙසැම්බරය වන විට එය දිනකට බැරල් මිලියන 1.57ක් සීමාවට ලඟා විය. දූන් ආන්ඩුවේ ඍෘජු ආදායමෙන් සියයට 94ක් තෙල් අපනයනයෙන් ලබා ගන්නා වූ රටක මෙම සාර්ථකත්වයන් ප්‍රබල බලපෑමක් ඇති කර තිබේ." *ඥැෂරුී ෑඩදකඩසබට ෂබීමරටැබජහ ^බා එයැ ඍසින දෙ ඤසඩසක ෑ්ර* (ඉරාකයේ නැගී එන ත්‍රස්තවාදය හා සිවිල් යුද්ධයේ අන්තරාය) පි.ඩසසසස%

ජනාධිපතිගේ පමනක් නොව ඔහුගේ පරිපාලනයේ සියලු ප්‍රමුඛයන්ගේ ම, මුලුමනින් ම පාහේ අදහාගත නොහැකි මුග්ධත්වය ද අදක්ෂකම ද යුද්ධය මගින් හෙලිදරව් කර තිබේ. කෝඩ්ස්මන් විසින් සැකසූ ඇස්තමේන්තුව - එනම් ආක්‍රමනයට පෙර සැලසුම් කිරීම හා ඉන්පසුව යුද්ධය ගෙන යාමේ සමස්ත පරිපාලනයට ම එරෙහි බිඳවට්ටන චෝදනාවකි. 2006 ජුනි 22 දින නිකුත් වූ ඔහුගේ වාර්තාවට අනුව

"ඉරාකයේ ජනඝාතක අවි පිලිබඳ තක්සේරු කිරීමේ දී රහස් තොරතුරුවල බොහෝ වැරදි සිදු වී තිබේ. කෙසේ වුවත් යුද්ධයට යෑමට පෙර ඉරාකයේ සමස්ත තත්වයත් ස්ථාවරත්වය ඇති කරන මෙහෙයුම් ද, ජාතිය ගොඩනැගීම ද, සම්මිශ්‍රිතව කාර්යක්ෂම ලෙස ගෙනයාමට එක්සත් ජනපදය අසමත් වුවහොත්, ත්‍රස්තවාදය පැනනැගීමේ අන්තරාය ගැනත් නිවැරදිව තක්සේරු කිරීමට එක්සත් ජනපද ප්‍රතිපත්ති හා මිලිටරි සැලසුම්කරුවන් අසමත් වීම සමග සසඳන කල මෙම දෝශ නොවැදගත් ලෙස පෙනී යයි. මෙම අසාර්ථකත්වයේ වග කීම බුද්ධි අංශ වෙත පැවරීම කල නොහැකි ය. එය, ජනාධිපතිගේ ද, උප ජනාධිපතිගේ ද, ජාතික ආරක්ෂක උපදේශකගේ ද, රාජ්‍ය ලේකම්ගේ ද, ආරක්ෂක ලේකම් හා ඒකාබද්ධ නායකත්වයේ සභාපතිගේ ද වගකීම වේ.

"ඉරාකය පිලිබඳව හැකිතාක් නිවැරදි චිත්‍රයක් සම්පාදනය කිරීමටත්, ආක්‍රමනයක ප්‍රතිවිපාකයන් තක්සේරු කිරීමටත්, පුලුවන්වන ආකාරයට, ප්‍රතිපත්ති සම්පාදකයන් ද, මිලිටරි සැලසුම්කරුවන් ද, ඔත්තු සේවා හා ප්‍රාදේශීය විශේෂඥයන් ද එක තැනකට ගෙන ඒම සියල්ලන්ගේ ම වගකීමක් විය. සාර්ථකත්වයේ අතිශයින් ම සුභවාදී අර්ථනිරූපනයක් සඳහා සැලසුම් කල ඉරාකයක සීමිත හා බෙහෙවින් ආත්මීය දෘෂ්ටියක් මත කටයුතු කිරීම, ජාතියේ ප්‍රමුඛ ප්‍රතිපත්ති සම්පාදකයන්ගෙත් මනාපය වූවා මිස අසාර්ථකත්වයේ අවදානම සඳහා නොවී ය.

"ස්ථාවරත්වය ගෙන ඒමේ මෙහෙයුම් සඳහා සැබෑ සැලැසුම්කරනයන් නොතිබුනි. සදාම් හුසේන් බලයෙන් පහ කිරීමෙන් ඉරාක ආන්ඩුව සුරක්ෂිතව ක්‍රියා කිරීමට ඉඩ සලසන්නේ යයි විශ්වාස කිරීම ප්‍රමුඛ ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ තේරීම වූ අතර ජාතිය ගොඩනැගීමට සම්බන්ධ වීමට ඔවුන්ට අවශ්‍ය නොවී ය. ඉරාක සන්නද්ධ හමුදාවන්ගේ වැදගත් කොටස් ඒකාබද්ධ හමුදාවන් දෙසට යොමුවනු ඇතැයි ද, නිශ්ක්‍රීය වීම හෝ සංකේතමය විරෝධයන් පමනක් දක්වනු ඇතැයි යන පදනම මත සැලසුම් සකසන ලදී.

ආන්ඩුවේ පැවැත්ම සහතික කිරීමට හෝ ඉරාකයේ ග්‍රාමීය ප්‍රදේශ පුරා ද, ප්‍රධාන නගරවල ද, ස්ථාවරභාවයත් ආරක්ෂාවත්, ඇති කිරීමට සැබෑ උත්සාහයක් දැරුනේ නැත. දශක ගනනාවක් පැවති බරපතල කන්ඩායම්ක හා වාර්ගික ආතතීන් අඩුලංසුවට දැමීම හෝ නොතකා හරින ලදී. ඉරාන ඉරාක යුද්ධයේ ආරම්භක වසරවලමෙන් ම, එනම් ඉරාක ජනගහනය මිලියන 17-18 පමන වූ කාලයේදී ඉරාක ආර්ථික සංවර්ධනය අඩපන කර තිබුනු සදාම් හුසේන් තන්ත්‍රයේ කටයුතු නොතකා හැරුනි. ඉරාකය තෙලින් පොහොසත් රටක් ලෙසත් තෙල් බිම් පුලුස්සා නොදැමුවේ නම් හා නූතන ධනේශ්වර ව්‍යුහයක ක්‍රියාවලියක් තුලට ඉබේම පරිවර්තනය වනු ඇති, ආර්ථිකය ඉක්මනින්ම යථාතත්වයට පත්වනු ඇති රටක් ලෙසත්, සලකනු ලැබුනි. [*Iraq's Evolving Insurgency and the Risk of Civil War* (ඉරාකයේ නැගී එන ත්‍රස්තවාදය හා සිවිල් යුද්ධයේ අන්තරාය) පිටු. xv-xvi]

කෝර්ඩ්ස්මන් බොහෝ වචනවලින් කරන්නේ ඇමරිකානු රජයේ ප්‍රමුඛයන්ට චෝදනා කිරීමයි. ඒ අතර ජනාධිපති බුෂ්, උප ජනාධිපති චේනි, ආක්‍රමනය අවධියේ රාජ්‍ය ලේකම්ව සිටි කොලින් පවෙල් හිටපු ජාතික ආරක්ෂක උපදේශක, දැන් රාජ්‍ය ලේකම් කොන්ඩලිසා රයිස්, ආරක්ෂක ලේකම් ඩොනල්ඩ් රම්ස්ෆෙල්ඩ් හා ආක්‍රමනය ආරම්භ වන අවධියේ ඒකාබද්ධ ප්‍රධානීන්ගේ සභාපතිව සිටි රිචඩ් මෙයර්ස් ද වෙති. රාජකාරිය අතපසු කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ වරද, යුද්ධයක් පවතිද්දී වාදකලහැකි, සාපරාධී අදක්ෂභාවයේ මට්ටමට නගියි. මෙම චෝදනාව මුලුමනින්ම යුක්තිසහගත ය. කෙසේ වුවද, රාජ්‍යයේ ඉහලම තලයේ දී එවන් තත්වයක් පැවතිය හැක්කේ කෙසේදැයි පැහැදිලි කිරීමට ඔහු අසමත් ය.

ඇමරිකානු ආක්‍රමනයේ සැබෑ අරමුන වූයේ, ඉරාකය තුල ස්ථාවර ප්‍රජාතන්ත්‍රවාදයක් සැබැවින්ම පිහිටුවීම නම්, සදාම් හුසේන් තන්ත්‍රය බිඳ වැටීමෙන් පසුව එක්සත් ජනපද මිලිටරියට මුහුනපෑමට සිදු වූ තත්වය පිලිබඳව, කුමන හෝ බැරෑරුම් සැලසුම්කරනයනක් නොමැතිවීම, පිලිබඳව තර්කාන්විත පැහැදිලි කිරීමක් අවශ්‍ය නොකරනවා විය හැක. කෙසේ වුවද අසාර්ථකත්වයන්, බුෂ් පරිපාලනයේ සැබෑ යුද අරමුනුවල සන්දර්භයෙහි ලා පරීක්ෂා කල විට අනවබෝධයට ඇත්තේ මඳ ඉඩකි.

ඉරාකය ආක්‍රමනය කිරීම ප්‍රජාතන්ත්‍රවාදය පිලිබඳ ප්‍රශ්නයක් නොවේ. එය කොල්ලකෑම පිලිබඳ ප්‍රශ්නයකි. ඉරාක තෙල් සංචිතවල පාලනය පිහිටුවා ගැනීම පිලිබඳ ප්‍රශ්නයකි. ඇමරිකානු කොල්ලයේ සාර්ථකත්වය සඳහා අවම දේශපාලන හා සමාජ පූර්වාවශ්‍යතාවන් පිහිටුවා ලීම සඳහා, අවශ්‍ය කුමක් ද යන්න පිලිබඳව බුෂ් පරිපාලනය එක්කෝ මුලුමනින්ම අඩු තක්සේරු කලා හෝ බැරෑරුම්ව සිතා බලා හෝ නොතිබුනේ ය යන්න නිසැක ය. එහෙත් අවසන් විග්‍රහයේ දී, ඉරාක යුද්ධයේ මූලෝපායික හා ක්‍රියාන්විත අසාර්ථකත්වයන් මුල්බැස තිබුනේ එම ව්‍යවසායෙහි අත්‍යාවශ්‍ය ස්වභාවය හා අරමුනු තුල ය. බුෂ් පරිපාලනය සිය යුද්ධය දියත් කලේ ඉරාකය ප්‍රතිනිර්මානය කිරීමට නොව එය කොල්ලකෑමට ය.

ඉරාක ව්‍යසනය හුදෙක් මිලිටරි සැලසුමක අසාර්ථකත්වය නොවී ය. එය, ආන්ඩුවේ සියලු අංශ එනම්, ව්‍යාපාරයන් විසින් පාලනය කෙරෙන දේශපාලන පක්ෂ දෙක ජනමාධ්‍යය, දශලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ ජීවිතවලට බලපාන තීන්දු ගන්නා පන්ති

පාලනයේ සමස්ත පද්ධතියම වෙලා ගත්, මුලු පද්ධතියේම අසාර්ථකත්වයයි. එය ඔවුන්ගේම රට තුල ද, දේශ සීමාවෙන් පිටත ද, ප්‍රජාතන්ත්‍රවාදී හා ජනතාවාදී සුලු සීමාවක් ඔවුන් මත පැටවී තිබුන ද ඔවුන්ගේ කටයුතුවල ප්‍රතිවිපාක කෙරෙහි වගකීමට බැඳී නොසිටින්නාවූ ද, වාතාවරනයක් තුල ක්‍රියාත්මක වන්නා වූ පාලනයකි.

"ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයට" ආරම්භයේ පටන් පස් වසරක් ගතවී තිබේ. එය වෙනත් යුද්ධවලට වඩා දිගු කාලයක් ගත කර තිබේ. 1812 යුද්ධයට තෙවසරයි, සිවිල් යුද්ධයට සිව්වසරයි, ස්පාඤ්ඤ ඇමරිකානු යුද්ධයට මාස ගනනාවකි, ප්‍රථම ලෝක සංග්‍රාමයේ ඇමරිකානු මැදිහත් වීමට වසර එක හමාරකි, දෙවන ලෝක යුද්ධයේ ඇමරිකානු සහභාගිත්වය සිව් වසරකට අඩු ය. කොරියාවේ එක්සත් ජනපදය මෙහෙය වූ ඊනියා "පොලිස් ක්‍රියාවලිය"ට තෙවසරකි. පැවති කාලයේ අර්ථයෙන්, මෙම නව යුද්ධය දැනටමත් එක්සත් ජනපද ඉතිහාසයේ සැලකියයුතු සිද්ධියකි. ඊනියා ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය සැබැවින්ම කුමක් ද යන්න පැහැදිලි කිරීමට බුෂ් පරිපාලනය තවමත් උත්සාහ දැරීම, මේ අනුව වඩාත් සැලකියයුතු දෙයක් වී තිබේ. අඩ දශකයක කාලසීමාවකින් පසුව ද, ආන්ඩුවට තවමත් එය සටන් කරන්නේ කුමක් සඳහා ද? කාට එරෙහිව ද හෝ සටන කුමක් ද යන්න පිලිබඳව තර්කාන්විත කෙසේවෙතත්, සාධාරන යයි පෙනීයන පැහැදිලි කිරීමක් හෝ ගොතාගැනීමට නොහැකි වී තිබේ.

පසු ගිය දෙසතියක කාලය තුල, සහයෝගය ගොනු කිරීම සඳහා බුෂ් පවත්වා ඇති එක් කථාවක දී ඔහු පලකලේ "අද අප සටන්වදින යුද්ධය මිලිටරි ගැටුමකට වැඩි දෙයකි. 21 වැනි සියවසේ තීරනාත්මක දෘෂ්ටිමය අරගලය එයයි."

මෙම වචන කියවන අයෙකුට, බුෂ් පරිපාලනය විසින් ගෙනයමින් සිටින දෘෂ්ටිවාදාත්මක අරගලය එහි ප්‍රායෝගික ප්‍රකාශනය අත්කරගන්නේ කෙසේදැයි ඇසීමට සිදු වේ.

"ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" එහි මුල් දිනවල පටන් ම, 18වන සියවසේ ඇමරිකානු විප්ලවයේ නායකයන්ට ආවේශය සැපයූ අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී දෘෂ්ටිවාදයේ උරුමය වූ, ව්‍යවස්ථාවෙන් සහතික කල ප්‍රජාතන්ත්‍රීය අයිතිවාසිකම්වල සමස්ත ව්‍යුහයටම, යටින් වලකැපීමේ හා විනාශ කිරීමේ උත්සාහයන් සමග එකට ගමන් කලේ ය. බුෂ් පරිපාලනය කැපවී සිටියේ ආඥාදායකත්වයේ ආරම්භක මූලධර්මයන්ට ය. ඒවා වඩාත් පැහැදිලිව පලවූයේ ජනාධිපතිගේ දූෂ්ට පාලනයේ විවෘත උපදේශකයන් ලෙස කටයුතු කරන ශ්‍රේෂ්ඨාධිකරන විනිසුරුවන්වන ඇන්ටොනින් ස්කාලියා හා ක්ලැරන්ස් තෝමස්ගේ වචන තුල පමනක් නොව, ප්‍රථම වතාවට ක්‍රියාවට නැගීමෙන් පස් වසරකට පසුව, පවත්නා බව බුෂ් විසින් ප්‍රසිද්ධියේ පිලිගෙන තිබෙන, රහසිගත සීඅයිඒ හිරගෙවල හා අබුග්‍රයිබ්හි වධකාගාර තුල, ඇමරිකානු මිලිටරියේ හා ඔත්තු සේවයේ නිලධාරින් විසින් සිදු කල ක්‍රියාවන් තුල ද වේ. බුෂ් සිය "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ආරක්ෂා කිරීමට ගන්නා උත්සාහය වඩාත් දීප්තිමත් මෙන් ම අභූත ප්‍රතිගතිතාවන් තුල බහුල ලෙස දැකගත හැක. නිදසුනක් ලෙස අගෝස්තු 31 දින ඔහු මෙසේ සඳහන් කලේ ය.

"මැදපෙරදිග තුල දිගහැරෙමින් ඇති අරගලය වටහා ගැනීමට අප ප්‍රදේශයේ වර්තමාන ඉතිහාසය දෙස බැලිය යුතු ය. අඩ සියවසක් පුරා මැදපෙරදිග තුල ඇමරිකාවේ මූලික ඉලක්කය වූයේ ස්ථාවරත්වය යි. අප සීතල යුද්ධය තුල සෝවියට් සංගමය සමග සටන් වැදි කාලයෙහි දී මෙය තේරුම් ගත හැකි ය. කොමියුනිස්ට්වාදය ප්‍රතික්ෂේප කල මැදපෙරදිග ආන්ඩුවලට උදව්කිරීම වැදගත් විය. එහෙත් දශක ගනනාවක් පුරා අන්තරායේ යම් ප්‍රවාහයන් මැදපෙරදිග තුල නැගෙමින් තිබේ. ප්‍රදේශයේ වැඩි හරියක් වෙලාගෙන ඇත්තේ අපේක්ෂා භංගත්වයෙන් හා එක තැන පල්වීමෙනි. තරුනයන්ගේ පරම්පරාවක්ම වැඩී ආවේ සිය ජීවිත යහපත් කර ගැනීමේ මඳ බලාපොරොත්තු සහිතව ය. බොහොමයක් රැඩිකල් අන්තවාදයේ බලපෑමට හසු විය. කිහිප ගුනයකින් ශක්තිමත් වූ ත්‍රස්තවාදී ව්‍යාපාරය ලෝකය පුරා ප්‍රචන්ඩත්වය බවට හැරුනේ වසර ගනනාවක් කැකෑරෙමින් පැවති අතෘප්තිය උතුරා යැමෙනි."

බුෂ් කියන බව පෙනී යන්නේ - මෙහි දී ඔහු නිවැරදිය - මහජනතාව අතර කොමියුනිස්ට්වාදයේ හා සමාජවාදයේ බලපෑම වර්ධනය වීමට එරෙහිව, අඩ සියවසකටත් වැඩි කාලයක් තුල එක්සත් ජනපදය විසින් ගෙනගිය අරගලය තුල අනුගමනය කල මර්දනකාරී ප්‍රතිපත්තිවල ප්‍රතිඵලය ලෙස මැදපෙරදිග ත්‍රස්තවාදී ව්‍යාපාර පැන නැගුනු බවයි.

1953 දී සීඅයිඒ විසින් ක්‍රියාත්මක කල ප්‍රජාතන්ත්‍ර විරෝධී කුමන්ත්‍රනයේ ප්‍රතිඵල වසයෙන් බලයට පත් වූ, මිලිටරි පොලිස් ආඥාදායකත්වය පෙරලා දැමූ විප්ලවයක් මධ්‍යයේ, හටගත් බව සඳහන් කිරීමට අසමත් වුවත්, ඉරානයේ ඇමරිකානු ප්‍රාන ඇපකරුවන් අල්ලාගැනීමේ සිද්ධිය, බුෂ් මෙහි දී අන්තවාදයේ වර්ධනයට නිදසුනක් ලෙස දැක් වීය.

බුෂ් පරිපාලනය විසින් පලකල සියලු වාචාල ප්‍රකාශ පසෙකට දැමූවිට "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" සැබෑ අරමුන වූයේ එක්සත් ජනපදයෙහි ගෝලීය ආධිපත්‍යය පිහිටුවීම යි. 2001 සිට එය අත්විඳි පරාජයන් හා අසාර්ථකත්වයන් තිබිය දී ම "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" අරමුන ලෝක ආධිපත්‍යය යි. මෙය බුෂ් පරිපාලනයේ පමනක් නොව, රිපබ්ලිකානු මෙන්ම ඩිමොක්‍රැටික් යන ප්‍රධාන අංශ සෑම එකකම ඉදිරි දර්ශනය විය.

ඉරානයට එරෙහි යුද්ධය සඳහා වැයෙන බෙර හඬ, එවන් යුද්ධයක ප්‍රතිවිපාක ව්‍යසනකාරී වුවත්, දිනක් පාසා වැඩෙමින් තිබේ. ඉරානයට එරෙහි එක්සත් ජනපද ප්‍රහාරයක්, ගෝලීය පරිමානයේ ප්‍රචන්ඩ කැලඹීමක් මුදා හරිනු ඇත. ඉරානය තුල මුහුනපා සිටින ජංජාලයෙන්, එක්සත් ජනපදය අත් මිදිය යුතුව තිබිය දී පවා, එවන් ක්‍රියාවකට සිත් යොමු කිරීමෙන් පෙන්නුම් කරනුයේ, ඇමරිකානු රාජ්‍යයේ ඉහල ම මට්ටම්වල පවතින වික්ෂිප්තභාවයේ හා මංමුලාවේ ස්වභාවයයි.

මෙවන් නොඉවසිලි භාවයක් ඇමරිකානු සමාජය තුල නිර්මානය කල ද්‍රව්‍යමය හා සමාජ කොන්දේසි විමසා බැලීම අවශ්‍ය කෙරේ.

## මතු සම්බන්ධයි

© www.wsws.org